Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ පිළිගැනීමේ නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම

බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බණ්ඩ 02 සේවා ගණයේ පිළිගැනීමේ නිලධාරී තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *වැටුප් කේතය* :- MN-1 2016 (රා. ප. ච. ලේ. 03/2016 අනුව)

*වැටුප් පරිමාණය* :- රු. 27,140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540

(රා. ප. ච. ලේ. 03/2016 හි උපලේඛන II අනුව වැටුප් ගෙවීම සිදු කරනු ලබයි.)

02. *බඳවා ගන්නා ශ්‍රේණිය* : III ශ්‍රේණිය

03. *සේවා කොන්දේසි* :- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට යටත් විය යුතුය.)

04. *බඳවා ගැනීමේ සුදුසුකම්* :

4.1 *අධ්‍යාපන සුදුසුකම්.-*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

*සහ*

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

4.2 *කායික සුදුසුකම්* : තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4.3 *වෙනත්* :

4.3.1 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

4.3.2 යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

4.3.3 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අවසන් දිනට අවම වශයෙන් වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.

4.3.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

4.3.5 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමවේදය* :

සුදුසුකම් ලත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින් බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

| *ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ලකුණු ලබා දෙන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| දේශපාලනික, සංස්කෘතික, සාමාජයීය හා ආර්ථික කරුණු සම්බන්ධයෙන් සාමාන්‍ය දැනීම | 30 | 50 |
| තනතුරට අදාළ රාජකාරී පිළිබඳ සාමාන්‍ය අවබෝධය | 30 | |
| මහජන සම්බන්ධතාවය | 25 | |
| භාෂා ප්‍රවීණතාවය - මව් භාෂාවට අමතරව වෙනත් භාෂා කතා කිරීමේ/අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව | 10 | |
| පෞරුෂය | 5 | |
| **මුළු එකතුව** | **100** | **50** |

06. *අයදුම්පත් එවනු ලබන පිළිවෙල* :

6.1 අයදුම්කරුවන් විසින් මේ සමග අමුණා ඇති ආකෘතිය අනුව, අයදුම්පත සම්පූර්ණ කර ''පිරිස් හා පුහුණු අංශය'', ප්‍රධාන ලේකම් කාර්යාලය (බ. ප.), අංක 204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත යන ලිපිනයට 2019.07.14 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාරදිය යුතුය. අයදුම්පත බහාලන ලිපි කවරයේ වම් පස ඉහළ කෙළවරේ ''ප්‍රධාන ලේකම් කාර්යාලයේ පිළිගැනීමේ නිලධාරී තනතුර'' යනුවෙන් සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසු ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.2 අයදුම්පත්‍රය රජයේ විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරීවරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු රු. 498,960 ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

07. මෙම නිවේදනයේ විධිවිධාන සලසා ඇති හෝ නොමැති කරුණක් සම්බන්ධයෙන් ගැටළු පැන නගින අවස්ථාවක දී එය බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
ප්‍රධාන ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාත.

ආදර්ශ අයදුම්පත

**ප්‍රධාන ලේකම් කාර්යාලයේ කළමණාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 02 සේවා ගණයේ පිළිගැනීමේ නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම**

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

01. (i) මුලකුරු සමග අගට යෙදෙන නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..............................

..............................

(ii) සම්පූර්ණ නම : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..............................

..............................

(iii) සම්පූර්ණ නම : (සිංහලෙන්) :..............................

..............................

02. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : කොළඹ : ☐ ගම්පහ : ☐ කළුතර : ☐

04. ස්ථිර ලිපිනය :....................................................................................................

05. දුරකතන අංකය :....................................................................................................

06. උපන් දිනය :....................................................................................................

07.2019.07.14 වැනි දිනට වයස :....................................................................................................

08. ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී : ☐ පුරුෂ : ☐

09. අධ්‍යාපන සුදුසුකම් :

*අ.පො.ස. (සා. පෙළ) විභාගය :*

වර්ෂය :..................... විභාග අංකය :...........................

*අ.පො.ස. (උ. පෙළ) විභාගය :*

වර්ෂය :..................... විභාග අංකය :...........................

| අ.පො.ස. (සා. පෙළ) විභාගය | | |
|---|---|---|
| | *විෂයය* | *සාමාර්ථය* |
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | | |
| 9 | | |
| 10 | | |

| අ.පො.ස. (උ. පෙළ) විභාගය | | |
|---|---|---|
| | *විෂයය* | *සාමාර්ථය* |
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

10. ....................................................................................................වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම් කර ඇති ඉහත තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමට ද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරව ම දනිමි.

........................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :...........................

11. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම.* (අනවශ්‍ය වචන කපා හරින්න.)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................................................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය........................................................ දින හා ඉදිරිපිට දී ඔහු/ඇයගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

සහතික කරන අයගේ නම :.....................................................................................................

අත්සන :.....................................................................................................

තනතුර හා නිල මුද්‍රාව :.....................................................................................................

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරිවරයෙකු පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු රු. 4,98,960 වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.)